## 1.1 හැඳින්වීම

මිනිස් මනස තුළ විසිරී විසිරී පැතිර පවතින අනේකවිධ වූ සන්තානගත සිතුවිලි විදාරණය කිරීමේ එක් අවස්ථාවක් ලෙසින් මිනිසා විසින්ම නිර්මාණය කළ කලාමාධ්‍යයන් මිනිස් ජීවිතය සෑම අතින්ම සුවපත් කරයි. මෙසේ ලෝකයේ බිහිවූ විවිධ කලාංගයන් අතරින් අතිශය ලෙස මිනිස් මනස හා බැඳී පවතින කලාවක් ලෙස සංගීතය හැඳින්විය හැකිය. මානව සමාජ ගත පුද්ගලයාට මව්කුසේ සිට සොහොනේ කොන දක්වා ජීවිතයේ සෑම අවස්ථාවකදී ම දැඩිව බැඳී පවතින්නකි සංගීතය. ලොව පුරා වෙසෙන සියලු මානවයින්ගේ භාව ප්‍රකාශනය උදෙසා බිහිවූ සංගීතය ලාංකේය කලාකෙත අස්වැද්දමින් එහි පෝෂණය උදෙසා වැදගත් මෙහෙයක් ඉටු කරයි.

ලංකාවේ සංගීත ක්ෂේත්‍රය පිළිබඳ සාකච්ඡා කිරීමේදී එය විවිධ දිශානතීන් ඔස්සේ දිව යන්නක් බව පෙනේ. එනම් සම්භාව්‍ය සංගීතය, සරල සංගීතය හා ජන සංගීතයයි. මෙහිදී වඩාත් වැඩි පිරිසකගේ නැඹුරුතාවයන් දක්නට ලැබෙන්නේ සරල සංගීත ක්ෂේත්‍රය කෙරෙහි ය. මෙය නාඩගම්, නූර්ති, බයිලා, කපිරිඤ්ඤා, නව නාට්‍ය, ගුවන් විදුලි ගී, ග්‍රැමෆෝන් ගී, ටෙලි නාට්‍ය ගී, චිත්‍රපට ගී ආදී වශයෙන් විවිධ පැතිකඩවල් කරා යොමු වී ඇත. නමුත් මේ සියල්ල අතරින් සිංහල රසිකයාට සංගීතය හෝ ගීතය යනුවෙන් ඇසූ පමණින් මතකට නැගෙන නිර්මාණ ශෛලිය වනුයේ සරල ගීතය යි.

සරල ගීතය මෙසේ බහුලව රසික අවධානයට යොමුවීම කෙරෙහි හේතුවූ කරුණු කිහිපයක් ඇත.

- ★ ව්‍යවහාරයට අනුකූල වන පරිදි ම සරල වූ සරල ගීතය පහසුවෙන් රස විඳිය හැකි සීමාවක සැකසුණ නිසා දිගු කලක් තිස්සේ පොදු රසවින්දනයට පාත්‍ර වූ සංගීතාංගයක් වීම.
- ★ සංගීතමය අත්දැකීමක් පමණක් ම නොවී සාහිත්‍ය කලාව හා සම්මිශ්‍රණව පවත්නා නිසා ගීතය බහුතර රසවින්දනයට ගොදුරු වී ඇත. සාහිත්‍ය කලාව මිනිසාට හුරුපුරුදු කලාංගයක් වීම මෙහිදී බලපානු ලබන සාධකය වේ.
- ★ ලාංකේය ශ්‍රව්‍ය පරිසරය සරල ගීතය අත්මිටා නොයැමට හුරුවන පරිදි ශ්‍රාවක මනස සකස් වී තිබීම හා දැනටත් එසේ සකස් කරවීම.

මේ ආදී විවිධාකාර හේතූන් වල දීර්ඝකාලීන බලපෑමෙන් සරල ගීතය අද පනතය වන විට ලංකාවේ සංගීත ක්ෂේත්‍රයේ බල අධිකාරිය බවට පත්වී ඇත. මේ ආකාරයට සුවිසල් ශ්‍රෝතෘන් ගම්භීරයෙන්ම පුරා ප්‍රචලිතව පවතින සරල ගීය තුළින් සිදුකළ හැකි මෙහෙවර අතිවිශාලය. මිනිස් මනස වන වන දැඩිව වැළඳගන්නා කලා නිර්මාණයන් තුළින් සමාජය විනිවිදව දකින කලාකරුවාගේ ආත්ම ප්‍රකාශනය සමාජගත කිරීම පැහැදිලිව ම සිදුකළ හැකි මහඟු කර්තව්‍යයකි. නමුත් මෙම වාතාවරණය ලාංකේය සංගීත සමාජයේ අන්තර්ගත සරල ගීත ක්ෂේත්‍රය යන්න තුළ දක්නට ලැබෙන්නේ අල්ප වශයෙනි.

මෙම වාතාවරණය යටතේ ලාංකේය සංගීත සමාජයේ වපසරිය දුබල ලෙස සීමාසහිත වීමත් හඳුනාගැනීමට සංගීතය හදාරන විද්‍යාර්ථියෙකු ලෙස මා හට හැකිවිය. එම සීමාව දුබල ලෙස පටු වීම නිසා සංගීත කලාවේ දිළිඳුභාවයක් දක්නට ලැබේ. එමෙන්ම දුබල ලෙස ජනප්‍රියභාවයට පත්ව ඇති සරල සංගීතයේ සීඝ්‍ර හැගීගිරීම හේතුවෙන් එහි කලාත්මක ධාරිතාව ලඝු බවක්ද දක්නට ලැබේ. ලාංකේය සංගීත ක්ෂේත්‍රයේ වර්තමාන යම් යම් පැහැසැලීම් වල ගැටළු සහගත භාවයන් දැකිය හැකි බැවින් සරල ගීතයේ නිෂ්පාදන ක්‍රියාකාරීත්වය පිළිබඳව අධ්‍යයනය කරමින් එම පවතින වාතාවරණයන්ට පසුබිම් වූ හේතු කාරණා අවබෝධකර ගැනීම කාලානුරූපී වටිනාකමින් ඇති කාර්යයක් බව මාගේ හැඟීම යි.

සිංහල සරල ගීතයේ නිෂ්පාදනය යනු ගීතයක් නිපදවන ආකාරය, බෙදාහරින ආකාරය හා ශ්‍රවණය කරන ආකාරය යි. මෙම සමස්තය ගීතයේ නිෂ්පාදනය හා සම්බන්ධ වේ. ඈත **අතීතයේ සිටම සරල ගීතයේ නිෂ්පාදනය සිදුවී තිබෙන්නේ වෙළඳපොළ පසුබිම් කරගෙන ය.** මූලික වශයෙන්ම සරල ගීතය සමාජගත වූයේ ගුවන්විදුලියේ ආගමනයත් සමගය. ඊට පෙර ග්‍රැමෆෝනය ආශ්‍රිතව ගීතය බිහි විය. ග්‍රැමෆෝන් අයිතිව තිබූ සමාගම් මගින් කලාකරුවන් පාලනය කිරීමක් එදා සිදු විය. ගුවන් විදුලිය මගින් සිදුවූයේ ද මෙයයි. නමුත් කලාකරුවන් විවිධ සීමා මායිම් වලින් තොවු කර ගන්නා ලදී.

වර්තමානයේ දී ද සිදුවන්නේ මෙබඳු තත්ත්වය කි. එනම් විශාල නිෂ්පාදන ආයතන කලාකරුවන් සමග ගිවිසුම්ගත වී වාණිජ වටිනාකම් අනුව ගීත ක්ෂේත්‍රය නිර්මාණය කිරීම යි. ප්‍රධාන වශයෙන් ගීතයේ නිර්මාණ කාර්යය සඳහා දායක වන ගීපද රචකයා, සංගීත රචකයා, ගායකයා යන ශ්‍රීපුද්ගලත්වය ඒකරාශී කොට ගීතය නම් වූ නිෂ්පාදනය එළිදක්වන්නේ වෙළඳ

ආයතන මගිනි. එමෙන් ම මෙසේ නිෂ්පාදනය වන ගීතයට ප්‍රේක්ෂක පිරිස ගොඩනැඟීම එනම් ඒ වටා රසික සහෘද ජනතාව ඒකරාශී කරවීම ද අද්‍යතනයේ සිදුවන්නේ නිෂ්පාදන ආයතන ඔස්සේ ය. ශ්‍රව්‍ය පරිසරය සකස් කිරීමට වෙළඳපොළ සපයන දායකත්වය සුළුපටු නොවේ. සරල ගීතයේ නිෂ්පාදනය උදෙසා ද, ප්‍රචාරණය උදෙසා ද වෙළඳපොළ මෙසේ කැප්වූ දායකත්වය සපයයි.

මේ සමස්ත ක්‍රියාවලිය පසුබිමෙහි ආර්ථික, සමාජයීය, දේශපාලන, සංස්කෘතික ව්‍යුහයන් දක්නට ලැබේ. එම සන්දර්භීය විවිධත්වය සරල ගීතයේ ආත්මය හා බැඳී පවතී. මේ අනුව අද්‍යතන සිංහල සරල ගීතයේ කලාත්මක ධාරිතාවන්ගේ සීමාවන් හා ඒ පසුපස ඇති ව්‍යුහාත්මක හැඩවූ සරල ගී නිෂ්පාදන ක්‍රියාදාමය ඔස්සේ හඳුනාගැනීම මෙම පර්යේෂණ නිබන්ධයෙහි අරමුණ වේ.

ගීතය හා එහි නිර්මාණාත්මක පාර්ශ්වය පිළිබඳව ද, ගීත විචාරයන් පිළිබඳව ද විවිධ අයුරින් කරුණු කාරණා ග්‍රන්ථගතව ඇතත් මේ සමස්තයෙහි ස්වභාවය නිර්ණය කිරීමට හේතු වන්නා වූ සමාජ ආර්ථික ගතිකයන් පිළිබඳව සිදුකෙරුණු විමර්ශනයන් අල්ප ය. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ද මෙබඳු මාතෘකාවක් පිළිබඳව අවධානය යොමු කොට නැත. පුවත්පත්, සඟරා වල මේ පිළිබඳ විවිධ මත සහිත ලිපි පළ වුව ද මෙම සමස්තය පිළිබඳ අදහස් දැක්වීම් සිදුවී නොමැත. එම හිඩැස පිරවීමටත්, සංගීත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ දැනුම පුළුල් කර ගැනීමටත් යම් කිසි අයුරින් දායක වීමේ අරමුණ ද මෙහිදී අපේක්ෂිත ය. නමුත් මෙහි අන්තර්ගත තොරතුරු සීමාසහිත විය හැකිය. තවත් බොහෝ අඩු ලුහුඬුකම් මේ ක්ෂේත්‍රයේ දක්නට ලැබේ. එබැවින් අනාගත විද්‍යාර්ථීන් මෙහි තවත් නවමු මංමාවත් ඔස්සේ සිය විමර්ශනයන් මෙහෙයවනු ඇතැයි සිතමි.

## 1.2 පර්යේෂණ ගැටළුව

අද්‍යතන සිංහල සරල ගීතයේ කලාත්මක ධාරිතාව සීමා කරන ව්‍යුහාත්මක සාධක කිමෙද?